# රාජ්‍ය වැවිලි ව්‍යාවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

# ඇබෑර්තු

වැවිලි අංශයේ, කීර්තිමත්, රජය සතු සංස්ථාවක් වන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් මාතලේ, මහනුවර, ගාල්ල, හපුතලේ ප්‍රදේශවල පිහිටි වතුයායන්වල පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා අභ්‍යන්තර අයදුම්කරුවන් ද ඇතුළත්ව අයදුම්පත් කැඳවනු ලැබේ.

1. තනතුර : **පරිපාලන නිලධාරී**

පළපුරුද්ද : ප්‍රාදේශීය වතු සමාගමක හෝ රජයට අයත් වතුයායක පරිපාලන නිලධාරියකු ලෙස වසර 03 ක් හෝ ජ්‍යෙෂ්ඨ ලිපිකරු තනතුරක වසර 05 කට වැඩි පළපුරුද්ද.

2. තනතුර : **ජ්‍යෙෂ්ඨ සහකාර ලිපිකරු**

පළපුරුද්ද : ප්‍රාදේශීය වතු සමාගමක හෝ රජයට අයත් වතුයායක ජ්‍යෙෂ්ඨ සහකාර ලිපිකරු තනතුරක වසර 03 ක් හෝ ලිපිකරු තනතුරක වසර 05 ක් හෝ කනිෂ්ඨ ලිපිකරු තනතුරක වසර 10 කට වැඩි පළපුරුද්ද.

3. තනතුර : **කනිෂ්ඨ ලිපිකරු**

අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද :

අ.පො.ස. (සා/පෙළ) විභාගය ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සහිතව සමත්වීම සහ ප්‍රාදේශීය වතු සමාගමක හෝ රජයට අයත් වතුයායක කනිෂ්ඨ ලිපිකරු / පුහුණු ලිපිකරු තනතුරක මාස 06 කට වැඩි පළපුරුද්ද.

4. තනතුර : **ක්ෂේත්‍ර නිලධාරී**

පළපුරුද්ද : ප්‍රාදේශීය වතු සමාගමක හෝ රජයට අයත් වතුයායක ක්ෂේත්‍ර නිලධාරියකු ලෙස වසර 03 කට හෝ සහකාර ක්ෂේත්‍ර නිලධාරී තනතුරක වසර 05 කට හෝ කනිෂ්ඨ සහකාර ක්ෂේත්‍ර නිලධාරී තනතුරක වසර 10 කට වැඩි පළපුරුද්ද.

5. තනතුර : **සහකාර ක්ෂේත්‍ර නිලධාරී**

පළපුරුද්ද : ප්‍රාදේශීය වතු සමාගමක හෝ රජයට අයත් වතුයායක සහකාර ක්ෂේත්‍ර නිලධාරී තනතුරක වසර 03 කට හෝ කනිෂ්ඨ සහකාර ක්ෂේත්‍ර නිලධාරී තනතුරක වසර 05 කට වැඩි පළපුරුද්ද.

6. තනතුර : **කනිෂ්ඨ සහකාර ක්ෂේත්‍ර නිලධාරී**

අධ්‍යාපනික සුදුසුකම් හා පළපුරුද්ද :

අ.පො.ස. (සා/පෙළ) විභාගය ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් ඇතුළත්ව සමත්වීම සහ ප්‍රාදේශීය වතු සමාගමක හෝ රජයට අයත් වතුයායක කනිෂ්ඨ සහකාර ක්ෂේත්‍ර නිලධාරී පුහුණු වන කනිෂ්ඨ සහකාර ක්ෂේත්‍ර නිලධාරී තනතුරක මාස 06 කට වැඩි පළපුරුද්ද.

7. තනතුර : **කර්මාන්තශාලා නිලධාරී**

පළපුරුද්ද : ප්‍රාදේශීය වතු සමාගමක හෝ රජයට අයත් වතු කර්මාන්තශාලාවක කර්මාන්තශාලා නිලධාරී තනතුරක වසර 03 කට හෝ ජ්‍යෙෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරී තනතුරක වසර 05 කට හෝ සහකාර කර්මාන්තශාලා නිලධාරී තනතුරක වසර 10 කට වැඩි පළපුරුද්ද.

8. තනතුර : **ජ්‍යෙෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරී**

පළපුරුද්ද : ප්‍රාදේශීය වතු සමාගමක හෝ රජයට අයත් වතුයායක, ජ්‍යෙෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරී තනතුරක වසර 03 කට හෝ සහකාර කර්මාන්ත ශාලා නිලධාරී තනතුරක වසර 05 කට වැඩි පළපුරුද්ද.

9. තනතුර : **සහකාර කර්මාන්තශාලා නිලධාරී**

පළපුරුද්ද : ප්‍රාදේශීය වතු සමාගමක හෝ රජයට අයත් වතුයායක සහකාර කර්මාන්තශාලා නිලධාරී තනතුරක වසර 03 කට හෝ කනිෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරී තනතුරක වසර 05 කට වැඩි පළපුරුද්ද.

10. තනතුර : **වතු වෛද්‍ය සහකාර**

පළපුරුද්ද : ප්‍රසිද්ධ ආයතනයක වෛද්‍ය සහකාර තනතුරක වසරකට හෝ කනිෂ්ඨ වෛද්‍ය සහකාර තනතුරක වසර 05 කට වැඩි පළපුරුද්ද.

වයස : පරිපාලන නිලධාරී, කර්මාන්තශාලා නිලධාරී, ක්ෂේත්‍ර නිලධාරී හා වතු වෛද්‍ය සහකාර තනතුරු සඳහා අවුරුදු 50 ට අඩු විය යුතු අතර, අනෙකුත් සියලු තනතුරු සඳහා අවුරුදු 45 ට අඩු විය යුතුය.

වැටුප් : දැනට බලපැවැත්වෙන සාමූහික ගිවිසුම් ප්‍රකාරව වේ.

සම්පූර්ණ ජීවදත්ත ඇතුළත්ව සකස් කළ අයදුම්පත්, අදාළ සහතිකවල පිටපත් සමග, ලියාපදිංචි තැපැලෙන්, සභාපති, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, අංක 257, සිරිධම්ම මාවත, කොළඹ 10, යන ලිපිනයට 2024 පෙබරවාරි 28 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති,**

**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව.**

**දිනය : 2024-02-08**